# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා විසින්
2026 සැප්තැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 අගෝස්තු මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[80 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පහත දැක්වෙන ක්‍රියා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වරදක් වන බවට විධිවිධාන සැලැස්වීම වේ:-

(අ) මෙත්ඇම්පිටමින් නිෂ්පාදනය කිරීම; සහ

(ආ) හෙරොයින්, කොකේන්, මෝෆින්, අබිං සහ මෙත්අම්පිටමින් හැර ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ I වන කොටසේ අ, ආ, ඇ, ඈ සහ ඉ වින්‍යාසවල සඳහන් කර ඇති යම් අන්තරායදායක ඖෂධයක් නිෂ්පාදනය කිරීම,

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මහ මුහුදේ දී, මෙත්ඇම්පිටමින් නිෂ්පාදනය කිරීම ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වරදක් වන බවට විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ ඇතැම් වැරදි සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් ඇප ලබා දීමට අදාළ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ -

(අ) කැනබිස් සැටිවා එල්. සහ කැනබිස් සැටිවා එල්. වල ස්වාභාවික සංයෝග අඩංගු යම් සැකසුමක් එම උපලේඛනයේ I වන කොටසේ ''ආ'' වින්‍යාසය යටතේ අන්තරායදායක ඖෂධයක් ලෙස නිශ්චිතව දැක්වීම; සහ

(ආ) 2026 අංක 7 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතේ 2 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගිකව ඒ උපලේඛනයේ III වන කොටසට ආනුෂංගික සංශෝධන සිදු කිරීම,

වේ.

**විෂවර්ග, අබිං සහ අන්තරායදායක**
**ඖෂධ වර්ග (සංශෝධන)**

එල්.ඩී. - ඕ 11/2026

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක      දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

218 වන අධිකාරයේ 54අ වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ “හෙරොයින් හෝ කොකේන් හෝ මෝෆින් හෝ අබිං” යන වචන වෙනුවට “හෙරොයින්, කොකේන්, මෝෆීන්, අබිං හෝ මෙත්ඇම්පිටමින්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(අඅ) හෙරොයින්, කොකේන්, මෝෆීන්, අබිං සහ මෙත්ඇම්පිටමින් හැර, තුන්වන උපලේඛනයේ I වන කොටසේ අ, ආ, ඇ, ඈ සහ ඉ වන වින්‍යාසවල දක්වා ඇති යම් අන්තරායදායක ඖෂධයක් නිෂ්පාදනය කරන යම් තැනැත්තකු මේ ආඥාපනතට විරුද්ධ වූ වරදකට වරදකරු වන අතර, ජූරි සභාවක් රහිත මහාධිකරණය විසින්

PL 15930 - 342 (2026/09)

වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය;”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, “හෙරොයින්, කොකේන්, මෝෆීන් හෝ අබිං” යන වචන වෙනුවට “හෙරොයින්, කොකේන්, මෝෆීන්, අබිං හෝ මෙත්ඇම්පිටමින්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(2) 84 වන සහ 85 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය, 54අඅ වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති සහ 54ආ වන වගන්තිය යටතේ වන වරදක් සඳහා සැකකරුවකු හෝ චූදිතයකු වන්නා වූ තැනැත්තකු-

(අ) ඒ වරද සිදු කිරීමේ දී ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර 77අ වන වගන්තිය යටතේ ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රකාරව ග්‍රෑම් සියයක් හෝ ඊට වැඩි වන්නා වූ විට හෝ, ඒ වාර්තාව

නොමැති අවස්ථාවක දී, ජාවාරම් කරන ලද, ආනයනය කරන ලද, අපනයනය කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද අන්තරායදායක ඖෂධයේ දළ බර ග්‍රෑම් සියයක් හෝ ඊට වැඩි වන්නා වූ විට; සහ

(ආ) සිදු කරන ලද ඒ වරද මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් වන්නා වූ විට,

අභියාචනාධිකරණය විසින් විශේෂ අවස්ථානුගත කරුණුවල දී මිස, ඇප මත නිදහස් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් සංජානනය කර අධිකරණ බලය පිළිගනු ලබන අවස්ථාවක දී, අභියාචනාධිකරණය විසින් සිය අභිමතය ක්‍රියාත්මක කරමින් ඒ කාරණය අදාළ මහාධිකරණය වෙත මාරු කළ යුතු බවට විධාන කරන්නේ නම් මිස, 77අ වන වගන්තිය යටතේ වන ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව මගින් අන්තරායදායක ඖෂධයේ ශුද්ධ බර ග්‍රෑම් සියයට වඩා අඩු බවට පසුව අනාවරණය වුව ද ඒ බව නොතකා, අභියාචනාධිකරණය විසින් ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයෙහි I වන කොටසේ ආ වින්‍යාසයේ 1 වන කොටසේ 26 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම ඇතුළත් කිරීමෙන්:-

| | | |
|---|---|---|
| “26අ | කැනබිස් | කැනබිස් සැටිවා එල්. |
| 26ආ | කැනබිස් | කැනබිස් සැටිවා එල්. වල ස්වභාවික සංයෝග අඩංගු යම් සැකසුමක්.”; සහ |

(2) ඒ උපලේඛනයේ III වන කොටසේ -

(අ) “(54අ වන වගන්තිය)” යන වචන සහ ඉලක්කම් වෙනුවට “(54අ වන සහ 54අඅ වන වගන්ති)” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපලේඛනයේ වගුවේ “කැනබිස්” යන අනුශීර්ෂය වෙනුවට “කැනබිස්/කැනබිස් සැටිවා එල්./ කැනබිස් සැටිවා එල්. වල ස්වභාවික සංයෝග අඩංගු යම් සැකසුමක්” යන අනුශීර්ෂය ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.